රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 03/2010 (I)

මගේ අංකය :- සීඑල්එස්/අන්තර් උසස්/V
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2010.07.26

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව අනුව පුස්තකාලයාධිපති සේවයේ II පන්තියට/ I පන්තියට හා විශේෂ පන්තියට විභාගයක් නොපවත්වා උසස් කිරීම.**

2010.04.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2010 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එහි 05 සහ 06 ඡේද වෙනුවට පහත සඳහන් ඡේද ආදේශ කරමින් සංශෝධනය කර ඇත.

5. 5.1 අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයට අයත් උසස්වීමට සුදුසුකම් ලබන සියලුම නිලධාරීන් මේ සමග අමුණා ඇති ආදර්ශ අකෘති පත්‍රය අනුව සකස්කරගත් අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් අයදුම්පතේ දක්වා ඇති විස්තර නිවැරදි බවට සහතික කර අයදුම්කරුගේ උප්පැන්න සහතිකය, පත්වීම් ලිපිය, ස්ථිර කිරීමේ ලිපිය, උසස්වීම් ලිපිය, අධ්‍යාපන සහතික සහ සුදුසුකම් සනාථ කරන අනෙකුත් සහතිකවල සහතික පිටපත් ද සමග තම අමාත්‍යාංශ ලේකම්ගේ ද නිර්දේශයන් සහිතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

5.2 අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල සේවය කර අංක 1620/22 දරණ 2009.09.24 දිනැති ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක වන 2009.09.02 දිනට පසුව විශ්‍රාම ලැබූ උසස්වීමට සුදුසුකම් ලබන පුස්තකාලයාධිපතිවරුන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2010 සමග ඉදිරිපත් කර ඇති අයදුම් පත්‍රය, ඉහත 5.1 ඡේදයේ සඳහන් පරිදි ඉදිරිපත් කළ යුතුය.

6 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2010.08.31 වේ.

03. එම චක්‍රලේඛයේ සඳහන් අනිකුත් අවශ්‍යතාවයන් තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක වනු ඇත.

ඩී.දිසානායක
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය